චක්‍රලේඛ අංක : 11/2022 (I)

WPCEC/MA 01/ චක්‍රලේඛ
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක 628 ,
ජනජය සිටි ගොඩනැගිල්ල,
8 වන මහල , නාවල පාර ,
රාජගිරිය.
2023.02. 17

බස්නාහිර පළාතේ,
සියළුම වි.සේ.ස. සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සමූපකාර ණය දෙන සමිති,
දිස්ත්‍රික් සමූපකාර මණ්ඩල හා අනෙකුත් සියළුම ලියාපදිංචි සමූපකාර සමිති
සභාපතිවරුන් වෙත.

<u>බඳවාගැනීමේ සුදුසුකම් සංශෝධනය</u>

බස්නාහිර පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ 11/ 2022 න් සංශෝධනය කරන ලද සමූපකාර සේවකයින් බඳවාගැනීමේ පටිපාටිය - 2011 හි සඳහන් වැටුප් පරිමාන අංක 101.2 හා 101.3 ට අදාල ප්‍රධාන විධායක නිලධාරී, සාමාන්‍යාධිකාරී, විධායක කළමනාකරු යන තනතුරු වල බඳවා ගැනීමේ මූලික සුදුසුකම් උපලේඛණ අංක 01 හි දැක්වෙන පරිදි නැවත සංශෝධනය කර ඇත. ඒ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 11/ 2022 චක්‍රලේඛයේ සඳහන් අනෙකුත් විධිවිධාන ඒ අයුරින්ම ක්‍රියාත්මකය.

02. ඉහත සංශෝධිත සුදුසුකම් මෙම චක්‍රලේඛය නිකුත් කරන දින සිට බලපැවැත්වේ.

කොමිෂන් සභා නියමය පරිදි,

එම්.ඒ.පී.ජයකොඩි.
ලේකම්
සමූපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත

පිටපත් :
1. ලේකම් පළාත් මාර්ග ප්‍රවාහන සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප. )- කා.දැ.ගැ.පි.
2. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ත්‍රාර් (බ.ප.) - කා.දැ.ගැ.පි.

| | තනතුරු නාමය | වැටුප් පරිමාණ අංකය | බඳවා ගැනීමේ ශ්‍රේණිය | වැටුප් පරිමාණය | උපරිම හා අවම වයස් සීමාව | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්(මූලික සුදුසුකම්) |
|---|---|---|---|---|---|---|
| 5. | සාමාන්‍යාධිකාරී/ විධායක කළමනාකරු | 101:2 | II | 02/2018 චක්‍රලේඛය පරිදි | අවු. 30-50 | (අ) 101:2 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර දෙක (02) ක හෝ 101:3 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර තුන (03) ක හෝ 102:4 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර තුන (03) ක හෝ 102:4 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර පහ (05) ක හෝ සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම<br>හෝ |
| | | | | | | (ආ) ජාතික සමුපකාර සංවර්ධන ආයතනය මඟින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ එක් (01) අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමඟ 102:5 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර හය (06) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම<br>හෝ |
| | | | | | | (ඇ) රජය පිළිගත් ආයතනයක ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ එක් (01) අවුරුද්දකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලා සහතිකයක් සමඟ පිළිගත් ආයතනයක විධායක නිලධාරි තනතුරක වසර හය (06) ක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ |
| | | | | | | (ඈ) පිළිගත් විශ්ව විද්‍යාලයයක උපාධියක් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ සමඟ අදාල ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර හතර (04) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම. |
| 7. | ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී/ විධායක කළමනාකරු | 101:3 | III | 02/2018 චක්‍රලේඛය පරිදි | අවු. 30-50 | (අ) 101:3 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර දෙක (02) ක සතුටුදායක සේවා පළපුරුද්දක් හෝ 102:4 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර තුන (03) ක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ |
| | | | | | | (ආ) ජාතික සමුපකාර සංවර්ධන ආයතනය මඟින් පවත්වනු ලබන ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ එක් (01) අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමඟ 102:5 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර පහ (05) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ |
| | | | | | | (ඇ) රජය පිළිගත් ආයතනයක ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ එක් (01) අවුරුදු ඩිප්ලෝමා පාඨමාලා සහතිකය සමග අදාල ක්ෂේත්‍රයේ විධායක/කළමනාකරණ මට්ටමේ වසර පහ (05) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.<br>හෝ |
| | | | | | | (ඈ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ සමඟ අදාල ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර තුන (03) කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම |